# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1993/25 – 2016 නොවැම්බර් 17 වැනි බ්‍රහස්පතින්දා – 2016.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 143, උතුරු කරඳන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, උතුරු කරඳන ගමේ පිහිටි, රත්නපුර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක ආර්/ඊඑච්එල්/2015/507 සහ 2015.10.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ''ඒ'' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.6070 ක් පමණ ''වන'' ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – වැවිල වත්ත හෙවත් කරඳන වත්ත – ප්‍රමාණය: හෙක්. 0.6070

උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන වැවිල වත්ත හෙවත් කරඳනවත්ත; දකුණට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන වැවිල වත්ත හෙවත් කරඳනවත්ත සහ ඇළ; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2014/එල්ඩී/280.
2016 ඔක්තෝබර් මස 03 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 123



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*